ජනතා විමුක්ති පෙරමුණ තුළ වර්තමානයේ ඇති වී තිබෙන අයහපත් අර්බුදකාරී ස්වභාවය එහි අනාගත ගමන්මගට ඉතාමත් අහිත කර ලෙස බලපා ඇත. නමුත් ඒ බව එහි නායකයෝ පිළිගැනීමට සූදානම් නැත. ඔවුන් ප්‍රකාශ කරන්නේ මෙය තමන්ට බළල් මයිලක් තරම්වත් වටිනා දෙයක් නොවන බවය. කොහොමත් ජනතා විමුක්ති පෙරමුණේ නායකයින් මෙවැනි ප්‍රශ්න මතුවූ විට ඔවැනි දේවල් ප්‍රකාශ කරන්න හරි රුසියෝය.

පක්ෂය තුළ අර්බුද එන්න එන්නම උස්සන්න වී කරවටක් ගිලීමට ගියත් ඔවුන් ප්‍රකාශ කරන්නේ ''අයියෝ ඔය ප්‍රශ්න තමන්ට එතරම් ප්‍රශ්නයක් නොවන බවය. එහෙම කියා අවසානයේ නහයත් ගිලී මැරෙන්න යන විට ''අනේ අපිව බේර ගනියෝ'' කියා මොරදීමට පටන් ගනිති.

මේ බව සෝමවංශ අමරසිංහ පාර්ශ්වය මිරිහාන පොලීසියට පැමිණිලි කළ විට පොලිසිය ක්‍රියාත්මක වී වාහනය සමඟ එය පැහැර ගැනීමට ක්‍රියා කළ පුද්ගලයන් හත් දෙනෙක් අත්අඩංගුවට ගෙන ඇත.

නමුත් මුලින් මතවාදී අරගලයක් බව ප්‍රකාශ කළ මෙම ගැටුම්කාරී තත්ත්වය එතැනින්ද නතර වූයේ නැත. සෝමවංශ අමරසිංහ පාර්ශ්වයේ මූලික අභිප්‍රාය ''ලංකා'' පුවත්පතේ අයිතිය සමන් සතු කර ගැනීමය. පක්ෂයේ ප්‍රධාන ලිඛිත සන්නිවේදන මාධ්‍ය එයයි. එබැවින් සිය සාමාජික ප්‍රජාවට තම මතය රැගෙන ගිය පුවත්පත තමන්ගේ ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය අතට පත්වෙනවාට කිසිසේත්ම කැමැති නැත.

ඉවත්කර සෝමවංශ අමරසිංහ පාර්ශ්වය එහි නිල බලය බලහත්කාරයෙන් මෙන් සියතට ගෙන ඇත.

මේ ස්වභාවය තුළ පක්ෂ මූලස්ථානයේ අයිතිය පතා ''මදනායක'' ඇතුළු බල ඇණිය අධිකරණයේ පිහිට පැතීමට සූදානම් වෙයි. පක්ෂයේ ''ජනමාධ්‍ය අංශය'' විසුරුවා ඇත. පක්ෂයේ සියලුම වගකිව යුතු තනතුරු හා ක්‍රියාකාරකම් වලින් සෝමවංශ අමරසිංහ විරෝධීන් ඉවත් කර ඒවායේ බලය ඩැහැ ගැනීමට සෝමවංශ අමරසිංහ පාර්ශ්වය උත්සුකවී ඇත.

දැන් සෝමවංශ අමරසිංහ හා ඊට විරුද්ධ පාර්ශ්වය පක්ෂයේ දේපළ එකිනෙකා බෙදා ගැනීමේ ගැටුමකට මුහුණපා සිටී. එකිනෙකා දෙපාර්ශ්වයකට බෙදී

එරෙහිව පක්ෂය තුළ අරගල කරන්නේ 1988, 89 දී ඝාතනයට ලක්වූ රංජිත්තම් ගුණරත්නම්ගේ සහෝදරයා වූ කුමාර් ගුණරත්නම් හෙවත් කුමාර් මහත්තයාය.

බොහෝ අය ප්‍රකාශ කළේ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රසිද්ධ නායකයා සෝමවංශ අමරසිංහ, වුවත් අප්‍රසිද්ධ නායකයා ''කුමාර් මහත්තයා'' බවය. එහි එතරම් අසත්‍යතාවක් නැත. තිරය ඉදිරිපස රූකඩකාරයන් ලෙස සෝමවංශ අමරසිංහ, ටිල්වින් සිල්වා, අනුර කුමාර දිසානායක, විජිත හේරත්, ඇතුළු පාර්ශ්වය ක්‍රියා කළත්, වැඩකාරයෝ හෙවත් මෙහෙය වන්නෝ සිටියේ තිරය පිටුපසය.

# ජනතා විමුක්ති පෙරමුණ පුපුරා ගියේ කෙසේද?

ඒ ජනතා විමුක්ති පෙරමුණේ ස්වභාවයයි. ඒ බව දැන් ජනතාවත් හොඳාකාරවම දන්නවා ඇත. නැත්නම් මෙවර වර්තමානයේ ජනතා විමුක්ති පෙරමුණ තුළ ඇතිවී ඇති අර්බුදකාරී ස්වභාවය ජනමාධ්‍ය තුළ පළවීමේදී එහි නායකයෝ ප්‍රකාශ කළේ ජනමාධ්‍ය ප්‍රකාශ කරන ආකාරයේ කිසිම අර්බුදයක් හෝ ප්‍රශ්නකාරී වාතාවරණයක් තම පක්ෂය තුළ නැති බවය.

ආණ්ඩුවේ අවශ්‍යතා ඉෂ්ඨ සිද්ධ කරමින් තම පක්ෂයට අවලාද නැඟීම උදෙසා ඇතැම් ජනමාධ්‍ය තමන්ට විරුද්ධව බොරු ප්‍රචාර කරන බව එම නායකයෝ ප්‍රකාශ කළ දෙයකි. ජනමාධ්‍යයේ පළවූ ඇතැම් ප්‍රවෘත්ති පවා නිවැරදි කිරීමට ඔවුන් විසින් ක්‍රියා කරනු ලැබීය. එහෙම ප්‍රකාශ කර අනික් පැත්ත හැරෙන කොට ජනතා විමුක්ති පෙරමුණ තුළ සිරවී තිබූ අර්බුදය බෝම්බයක් පිපිරුණා සේ එක පාරටම පිපිරී ජනමාධ්‍ය හරහා සමස්ත සමාජයට විවර වීමෙන් එහි නායකයෝ අන්ද මන්ද වුයේ කිසිවක් සිතා ගැනීමට නොහැකි ලෙසය.

ඊට පසු ජනමාධ්‍ය තමන්ගේ දෙපතුළට ගෙන්වා ගනිමින් එකිනෙකාට එරෙහිව දෙස් දෙවොල් දෙමින් අවලාද අපහාස නගමින් තම තමන් සුදනන් වීමට ජනතා විමුක්ති පෙරමුණේ එකිනෙකා වලිකෑව බව අමුතුවෙන් කිවයුතු දෙයක් නොවේ.

එයා පක්ෂයේ විනය උල්ලංඝණය කළා. ඒ නිසා අපි එයාව පක්ෂයෙන් අයින් කළා. ඒගොල්ලෝ ආණ්ඩුවට කඩේ යනවා. ඒ කණ්ඩායමේ අය රෝ ඔත්තුකරුවෝ. පක්ෂය දෙකඩ කිරීමට එන්.ජී.ඕ. වලින් සල්ලි අරන් ආණ්ඩුවට මුක්කු ගහනවට අපි කැමති නෑ. ඒකයි මේ සියලු අර්බුද ඇති වීමට හේතුව. තනි දේශපාලන ගමනක් යන්නේ නැතිව එක එක පක්ෂ සමඟ සන්ධාන ගහන්න ගිය නිසා තමයි මේ අර්බුද. යනාදී ආකාරයට මේ දෙපාර්ශ්වයේම අය එකිනෙකාට එරෙහිව එළිපිටම චෝදනා එල්ල කරන්නට වුයේ එතෙක් කලක් පක්ෂය ඇතුළේ සැඟවී තිබූ අර්බුදය එළියට විසිවෙමිනි.

මෙම අර්බුදකාරී වාතාවරණය මතවාදී අරගලයක් මිස වෙනත් දෙයක් නොවන බව ජනතා විමුක්ති පෙරමුණේ නායකයන් ප්‍රකාශ කරන දෙයකි. නමුත් අපට නම් පෙනෙන්නේ මුලින් මතවාදී අරගලයක් ලෙස ඇරඹි මෙම අයහපත් ස්වභාවය දැන් ගුටි කෙළියක් දක්වා වර්ධනය වී ඇති බවය

ජනතා විමුක්ති පෙරමුණේ ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී අජිත් කුමාරගේ කෝට්ටේ මාදිවෙල පිහිටි කාර්යාලය තුළ ඇති වූ ගුටි හැට හුවමාරුව එම ගුටි කෙළියේ ආරම්භක බීජයන් ලෙස සඳහන් කළ හැකි ය. එම කාර්යාලය තුළ සිදු වූ රුපියල් ලක්ෂ 9 1/2 ක මූල්‍ය වංචාවක් ඊට මූලික හේතුව වී ඇත. එය සෝමවංශ අමරසිංහ පාර්ශ්වයේ කමලරත්න නැමැති අයෙකු විසින් සිදුකර ඇති බව කියැවේ.

මේ හේතු කොට ගෙන ඔහුට අනෙක් පාර්ශ්වයේ පිරිසක් පහරදීමෙන් මෙම ගුටි කෙළියට මග පෑදී ඇත. අවසානයේ පහරකෑමට ලක්වූ පුද්ගලයාට රෝහල් ගතවීමට සිදු විය. පහරදීම සිදුකළ අයට මිරිහාන පොලීසියේ අත් අඩංගුවට පත්වීමට සිදු විය.

ඉන් නොනැවතුණු සිදුවීම අවසානයේ නතර වුණේ රහස් පොලිසියෙනි. මූල්‍ය වංචාව පිළිබඳව පුළුල් පරීක්ෂණයක් පැවැත්වීම උදෙසා රහස් පොලීසිය අජිත් කුමාරගේ කාර්යාලයේ තිබූ පරිගණක යන්ත්‍ර පවා රැගෙන යනු ලැබීය.

තත්ත්වය එතැනින් කෙළවර වුණේ නැත. ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ ''ලංකා'' පුවත්පතේ බලය රැක ගෙන තිබුණේ සෝමවංශ අමරසිංහට විරුද්ධ පාර්ශ්වයට නියෝජනය කරන පුබුදු ජාගොඩ පිල විසිනි.

එබැවින් ලංකා පුවත්පත හරහා තමන්ට පහර දේ යැයි සැකයක් සෝමවංශ අමරසිංහ පාර්ශ්වය තුළ පැවැතිණි එබැවින් සෝමවංශ අමරසිංහ ඇතුළු පිරිසක් ''ලංකා'' පුවත්පතේ බලය සියතට ගැනීම උදෙසා එම කාර්යාලයට ගිය මොහොතේ එහි පැමිණි පුබුදු ජාගොඩ පාර්ශ්වයේ පිරිසක් සෝමවංශ අමරසිංහ ඇතුළු පිරිස පැමිණි වාහනය පැහැර ගෙන ගොස් ඇත.




ලංකා පුවත්පතේ බලය අල්ලා ගෙන සිටින්නේ සෝමවංශ අමරසිංහ විරෝධී පාර්ශ්වය විසිනි. එය ඔවුන්ට බලගතු ප්‍රශ්නයකි. මේ නිසා සෝමවංශ පාර්ශ්වය අධිකරණයෙන් වාරණ නියෝගයක් අරගෙන එහි මුද්‍රණ කටයුතු පවා අත්හිටුවීමට පියවර ගැනිණි. ලංකා පුවත්පත මුද්‍රණය කළේ ''සන්ඩේ ලීඩර්'' පුවත්පත් ආයතනය මගිනි. පොලීසිය අධිකරණ නියෝගයට අනුව එම ස්ථානයට කඩා වැදී මුද්‍රණය වෙමින් තිබූ පුවත්පත් 24,000 ක් සිය භාරයට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇත.

මේ ලියන මොහොත වන විට ලංකා පුවත්පත වෙළඳපොළට නිකුත් වන්නේ නැත. මේ නිසා එහි පාඨකයෝ විශාල පිරිසකට වෙනත් විකල්ප මාධ්‍ය වෙත පියවර තැබීමට සිදුවී ඇත. සමාජයට මෙතෙක් කාන්දු වූ ජනතා විමුක්ති පෙරමුණේ මතවාදයට මේ හරහා අවහිරතා මතුවී ඇත.

ඊළඟට වැඩිම අර්බුදයට ලක්වී ඇත්තේ බත්තරමුල්ල

> ***පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වන ''රංජිත්තම් ගුණරත්නම්'' දෙමළ ජාතිකයකු වුවත්, ඔහු සටන් කළේ ප්‍රභාකරන් මෙන් ජාතිවාදී දෙමළ අරගලයක් වෙනුවෙන් නොව, සියලු දෙනාටම නිදහසේ ජීවත්වීමට මග පාදන සමාජවාදී මාවතක් වෙනුවෙනි.***

පැලවත්තේ පිහිටි ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ මූලස්ථානයයි. ජනතාවගේ ආධාර මත රුපියල් කෝටි 12 ක පමණ මුදලකින් ඉදි වූ මෙම සුපිරි නිවහනේ නිල බාරකාරත්වය තිබුණේ ''මදනායක'' නැමැති අයෙකුටය. ඔහු 1988 දී කටුනායක ගුවන් හමුදා කඳවුරට දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය මගින් ප්‍රහාර එල්ල කළ මොහොතේ ප්‍රහාරයට සහභාගි වී පාදයක් අහිමි වූ අයෙකි. දැන් ඔහු ගමන් කරන්නේ කිහිළි ආධාරකයක් උපයෝගී කර ගෙනය.

ඔදා සිට පක්ෂය සමඟ නිරතුරුව වැඩ කරන ''මදනායක'' කාලයක් අත්අඩංගුවට පත්වී සිරගතවී නිදහස්ව පැමිණි අයෙකි. ඔහු දැන් නියෝජනය කරන්නේ සෝමවංශ අමරසිංහ විරෝධී පිලය. මේ නිසා ''මදනායක'' ඇතුළු ඔහුගේ පිරිස් බල ඇණිය පක්ෂ මූලස්ථානයේ සියලුම වැඩ කටයුතු වලින්

ඒවායේ අයිතිය උදෙසා සටන් වැදීමට පටන් ගෙන ඇත.

මේ කරුණු කාරණා වලින් පැහැදිලි වන්නේ කුමක්ද? මෙය මතවාදී අරගලයක් පමණක් නොව, ඊට එහා ගිය ගැටුමක් දක්වා වර්ධනය වී ඇති බවය. මෙහි නිමාව කොතැනින් කෙළවර වේදැයි ප්‍රකාශ කිරීමට තවමත් කල්වේලා වැඩිය.

කවුරුත් බලපොරොත්තු නොවූ ආකාරයට ජනතා විමුක්ති පෙරමුණ තුළ මතුවී ඇති මෙම ගැටුම්කාරී තත්ත්වයට මුහුණපා ඇත්තේ සෝමවංශ අමරසිංහ පිල හා කුමාර් ගුණරත්නම් පිලය. කුමාර් ගුණරත්නම් යනු 1988 සිට පක්ෂයේ තිරය පිටුපස යාවජීව සාමාජිකයකුව සිටින අංක එකේ වැඩකාරයෙකි.

ඔහුගේ සහෝදරයාද ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් 1988 දී දිවි පිදූ අතීත දේශප්‍රේමියෙකි. ''රංජිත්තම් ගුණරත්නම්'' යනුවෙන් පක්ෂයේ දේශපාලන මණ්ඩලය තුළ යාවජීව නායකයකු ලෙස 1988, 89 ක්‍රියා කළ ඔහු රෝහණ විජේවීරගේ විශ්වාසවන්ත සගයෙකි. 1988, 89 යුගය තුළ පක්ෂයේ බර කරට ගෙන එවකට පාලන බලය ඉසිලූ හිටපු ජනාධිපති රණසිංහ ප්‍රේමදාසගේ මිනීමරු පාලනයට එරෙහිව සටන් වැදුණු ''රංජිත්තම් ගුණරත්නම්'' රෝහණ විජේවීර අත්අඩංගුවට පත්වී ඝාතනයවීමත් සමගම ඔහුවත් අත්අඩංගුවට පත්වී ඝාතනය විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියකු වන ''රංජිත්තම් ගුණරත්නම්'' දෙමළ ජාතිකයකු වුවත්, ඔහු සටන් කළේ ප්‍රභාකරන් මෙන් ජාතිවාදී දෙමළ අරගලයක් වෙනුවෙන් නොව, සියලු දෙනාටම නිදහසේ ජීවත්වීමට මග පාදන සමාජවාදී මාවතක් වෙනුවෙනි. අවසානයේ රංජිත්තම් ගුණරත්තට එම පිරිසිදු චේතනාවන් පෙරදැරි කර ගෙන ජීවිතයෙන් සමුගැනීමට සිදු වූයේ භීෂණයේ රුදුරු හස්තයට ගොදුරුවීම නිසාය.

සිය සහෝදරයා ගෙන් ගිළිහුණු රතු කොඩිය සියතට ගත් කුමාර් ගුණරත්තම් ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් සුවිශාල වැඩ කොටසක් කර ඔහුද 1988 දී අත්අඩංගුවට පත්වී දිගු කලක් සිරගතවී සිටියේය. අද සෝමවංශ අමරසිංහ පාර්ශ්වයට

එයින් කියැවෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ තුළ ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ යනුවෙන් කොටස් දෙකක් සිටි බවය. එය සැබෑවකි. ජනතා විමුක්ති පෙරමුණ තුළ පැහැදිලි වශයෙන්ම එවැනි කොටස් දෙකක් තිබිණි. එය පුදුමවීමට කරුණක් නොවේ. ඇත්ත කතාව එයයි.මෙය සාමාන්‍යයෙන් ඕනෑම විප්ලවවාදී කොමියුනිස්ට් ව්‍යාපාරයක දැකිය හැකි සාමාන්‍ය දෙයකි. ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ යනුවෙන් කණ්ඩායම් දෙකක් ඇත. බොහෝ අය ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමේදී අධිරාජ්‍යවාදී ධනපති ආණ්ඩු නිතරම උත්සාහ කරන්නේ තමන්ගේ ධනේෂ්වර පැවැත්මට තර්ජනයක් වන මෙවැනි විප්ලවාදී ව්‍යාපාර මර්දනය කර විනාශ කිරීමටය.

එබැවින් එම තත්ත්වය නිවැරදි ආකාරයට හඳුනා ගෙන සිටින විප්ලවාදී ව්‍යාපාර මෙලෙස ප්‍රසිද්ධ හා අප්‍රසිද්ධ යනුවෙන් කොටස් දෙකකට බෙදී පක්ෂය තුළ ක්‍රියා කරන්නේ යම් හෙයකින් මර්දනකාරී තත්ත්වයක් පක්ෂයට එල්ල වුවහොත් එයට සාර්ථකව මුහුණදීමේ අපේක්ෂාවෙනි.

යම් හෙයකින් ප්‍රසිද්ධියේ පෙනී සිටින පිරිස කිසියම් අනතුරකට ලක් වුවහොත්, අප්‍රසිද්ධියේ සිටින පිරිස පක්ෂය කිසිදු ප්‍රශ්නයකින් තොරව ඉදිරියට ගෙන යනු ඇත. එවිට පුද්ගල චරිත වලට ප්‍රශ්නකාරී තත්ත්වයක් උදාවුවද, පක්ෂයට කිසිදු ප්‍රශ්නයක් වන්නේ නැත. එය අනාගත තත්ත්වයන් දෙස නිවැරදි උල්කල්පනයකින් සිතා බලා කටයුතු කරන විප්ලවාදී පක්ෂයක ස්වභාවය වනු ඇත. ප්‍රසිද්ධියේ පෙනී සිටින පිරිස ප්‍රසිද්ධියේ සිය දේශපාලන මතවාදයන් ජනතාව අතරට රැගෙන යමින් ජාතික තලයේ දේශපාලනයක නිරත වුවද, පක්ෂය වෙනුවෙන් සුවිශාල වැඩ කොටසක් කරන වැඩකාරයෝ සිටින්නේ අප්‍රසිද්ධ කණ්ඩායම තුළය.

ශ්‍රී ලාල් ප්‍රියන්ත

කොටින්ම කිවහොත්, ප්‍රසිද්ධියේ පෙනී සිටින කාණ්ඩායමට ප්‍රසිද්ධියේ සිය දේශපාලන ගමන් මග කරගෙන යෑම උදෙසා අවශ්‍ය මංපෙත් විවර කරන්නේ අප්‍රසිද්ධ කණ්ඩායමය. ඔවුන් ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික තලය දක්වා සියලුම දේශපාලන සංවිධාන කටයුතු සිදුකරනු ඇත.

ශාඛා කමිටු පිහිටුවමින්, දිස්ත්‍රික් කමිටු පිහිටුවමින්, අලුත් සාමාජික සාමාජිකාවන් පක්ෂයට බඳවා ගනිමින්, අරමුදල් රැස් කිරීමේ ව්‍යාපෘති දියත් කරමින්, පක්ෂය සම්පූර්ණයෙන්ම පාහේ භෞතික හා න්‍යාත්මක වශයෙන් ශක්තිමත් කිරීමේ පුරෝගාමී වැඩ කොටසක් කරන්නේ අප්‍රසිද්ධ කණ්ඩායමය. එය ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ සංයුතිය පිළිබඳව නිවැරදි වැටහීමක සිටින අය නොදන්නා දෙයක් නොවේ. මෙම සැබෑ තත්ත්වය දැන හෝ නොදැන සිටින දේශපාලන අදබාල පිරිස් ප්‍රකාශ කරනුයේ ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ යනුවෙන්

10 පිටට

